## සාමාන්‍ය සමය තිස්දෙවන ඉරුදින | දේව ප්‍රකාශන

08-11-15

## පළමුවන දේව ප්‍රකාශනය

1 රාජාවලිය 17:10-16

රාජාවලිය පළමුවන පොතෙන් උපුටා ගත් කොටසකි.

**වැන්දඹු ස්ත්‍රිය කුඩා රොටියක් සාදා දිවැසිවරයාට දුන්නාය.**

එලියා පිටත්ව, ශාරෙපත් නගරයට ගොස් වාසල් දොරටුවට පැමිණි කල, වැන්දඹු ස්ත්‍රියක එහි දර අහුලනු දැක, ඈට අඬගසා, "කරුණාකර මට බොන්න භාජනයකට වතුර ටිකක් ගෙනෙන්නැ"යි කීවේ ය. ඈය එය ගෙනෙන්නට යන අතර ඔහු ඈට අඬගසා, "කරුණාකර ඔබේ අතින් රොටී කෑල්ලකුත් මට ගෙනෙන්නැ"යි කීවේ ය. එවිට ඈ කතා කොට, "බඳුනක පිටි මිටකුත්, කුලාවක තෙල් ටිකකුත් මිස මා ළඟ රොටී නැත. ඒවා සාදා ගන්නට දර කෑලි දෙකක් අහුලමි. මටත්, මාගේ පුත්‍රයාටත් තිබෙන ඒ අන්තිම කෑම වේල අනුභව කළ පසු නහින්නෙමු යි ඔබේ ජීවමාන දෙවි සමිඳුණන් වහන්සේගේ නාමයෙන් දිවුරමි"යි කීවා ය. එලියා ඈට කතා කොට, "බිය නොවන්න, ගොස් ඔබ කී හැටියට කරන්න. එහෙත්, පළමුකොට එයින් මට කුඩා රොටියක් සාදා මා ලඟට ගෙනෙන්න. පසුව ඔබටත්, ඔබේ පුත්‍රයාටත් සාදාගන්න. මන්ද, දෙවි සමිඳුණන් වහන්සේ මෙසේ වදාරන සේක: "සමිඳුණන් මිහි පිට වැස්ස එවන දවස දක්වා පිටි බඳුන ඉවර වන්නේ නැත. තෙල් කුලාව අඩු වන්නේ නැත"යි කීවේ ය. ඈ ගොස් එලියා කී හැටියට කළා ය. එසේ ඈ ද ඔහු ද ඇගේ ගෙයි වැසියෝ ද බොහෝ දවස් ඒවා අනුභව කළෝ ය. ස්වාමින් වහන්සේ එලියා ලවා දෙන ලද උන් වහන්සේගේ පණිවුඩය ප්‍රකාර පිටි බඳුන හිස් නොවී ය. තෙල් කුලාව අඩු නොවී ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 146:6-10

පිළිතුර: මාගේ සිත සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

ගීය: සමිඳුණෝ සදාකල් ම විශ්වාසී ව සිටින සේක. එතුමාණෝ පීඩා විඳින්නන්ට යුක්තිය ඉටු කර දෙන සේක. සාගිනිවූවනට ආහාර දෙන සේක.

එතුමාණෝ සිරකරුවන් මුදන සේක. අන්ධයන්ගේ ඇස් පහදන සේක. වැටී ගියවුන් නගා සිටුවන සේක. සමිඳුණෝ දමිටුන්ට ප්‍රේම කරන සේක.

විදේශීන් ආරක්ෂා කරන සේක. අනාථයන්ට හා වැන්දඹුවන්ට උපකාර කරන සේක. එහෙත්, දුදනාගේ යෝජනා සුන් කරන සේක.

සමිඳුණෝ සදහට ම රජකම් කරන සේක. එම්බා සියොන් නගරය! ඔබේ සමිඳුණෝ සියලු පරම්පරා දක්වා රජකම් කරන සේක. සමිඳුන්ට ප්‍රශංසා වේවා!

## දෙවන දේව ප්‍රකාශනය

හෙබ්‍රෙව් 9:24-28

හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**(පාපය දුරු කරන පිණිස එකම වරක් ක්‍රිස්තුස් වහන්සේ දිවි පිදූ සේක.)**

මන්ද, ක්‍රිස්තුන් වහන්සේ අප උදෙසා දෙවියන් වහන්සේ අබිමුවෙහි දැන් පෙනී සිටින පිණිස, නියම ශුද්ධස්ථානයේ ආදර්ශය ලෙස අතින් සෑදූ ශුද්ධස්ථානයකට නොව, ස්වර්ගයට ම ඇතුළු වූ සේක. නායක පූජකයා අනුන්ගේ ලේ රැගෙන අවුරුදු පතා

ශුද්ධස්ථානයට, ඇතුළු වන්නාක් මෙන්, උන් වහන්සේ නැවත නැවතත් තමන් ම ඔප්පු කරන පිණිස ඇතුළු නො වූ සේක. එසේ නොවූයේ නම්, ලෝකය මැවීමේ පටන් නොයෙක් වර, උන් වහන්සේට වද වේදනා විඳීම අවශ්‍ය වනු ඇත. එහෙත් උන් වහන්සේ තමන් ම පූජා කිරීමෙන් පාපය දුරු කරන පිණිස මේ යුගාන්තයේ දී සදහට ම එක වරක් ප්‍රකාශ වූ සේක. තවද එක වරක් මරණයත්, ඉන්පසු විනිශ්චයත් මිනිසාට නියම ව ඇති සේ ම, බොහෝ දෙනෙකුගේ පව් දුරු කරන පිණිස එක ම වරක් ක්‍රිස්තුන් වහන්සේ දිවි පිදූ සේක. තවද, පාපය දුරු කරන පිණිස නොව, උන් වහන්සේගේ ආගමනය බලා සිටින්නන්ට ගැළවීම දෙන පිණිස, උන් වහන්සේ දෙ වන වර ප්‍රකාශ වන සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

එළිදරව්ව 2:10

ආලේලූයා! ආලේලූයා!
"මරණය දක්වා විශ්වාසී ව සිටින්න.
එවිට මම ඔබට ජීවන කිරුළ ප්‍රදානය කරමි"යි සමිඳුණෝ වදරන සේක.
ආලේලූයා!

***හෝ***

මතෙව් 5:3

ආලේලූයා! ආලේලූයා!
"බැගෑ සිතින් දෙවි සරණ පතන්නෝ භාග්‍යවන්තයෝ ය; ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය."
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 12:38-44

මාක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**("මේ දිළිඳු වැන්දඹුව අනික් හැම දෙනාට ම වැඩියෙන් දැමුවාය.")**

ජේසුස් වහන්සේ සිය අනුශාසනාවේ දී කතා කරමින්, "විනයධරයන්ගෙන් පරෙස්සම් වන්න. ඔව්හු දිග උතුරු සළු හැඳ සක්මන් කරන්න ද වෙළෙඳපොළවල දී ගෞරවාචාර ලබන්න ද ප්‍රිය වෙති; ධර්මශාලාවල දී මූලාසනවලටත්, මංගල භෝජනවල දී සම්භාවනීය ආසන ලබන්ටත් ප්‍රිය වෙති; වැන්දඹුවන්ගේ ගේදොර කා දමති; පෙනුමට දිගින් දිගට යාච්ඤා කරති; මොවුහු වඩාත් බරපතල දඬුවමක් ලබති"යි වදාළ සේක.

උන් වහන්සේ දේව මාළිගාවේ මුදල් ගබඩාව ඉදිරියේ වැඩ හිඳ සෙනඟ එයට මුදල් දමනු බලා හුන් සේක. ධනපතීහු බොහෝ දෙනෙක් බොහෝ මුදල් දැමූ හ. එක් දිළිඳු වැන්දඹුවක් අවුත්, සතයක් පමණ වටිනා තඹ සල්ලි දෙකක් දැමුවා ය. උන් වහන්සේ ශ්‍රාවකයන් තමන් වෙත කැඳවා, "සැබැවින් ම මම ඔබට කියමි, මේ දිළිඳු වැන්දඹුව ගබඩාවට මුදල් දැමූ අනික් හැම දෙනාට ම වැඩියෙන් දැමුවා ය. ඒ කවුරුත් තමන්ගේ වැඩිපුර මුදලින් යමක් දැමූ හ. එහෙත් මෑ, දුප්පත් ව සිටිය දීත් සිය දිවිපෙවෙත සඳහා තිබුණු මුළු වත්කම ම දැමුවා ය"යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.